**2022.12.13 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. බී. කන්දසාමි මයා | - | ගරු සභාපති |
| 2. වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. එස්. සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. කේ.එම්. විමලසිරි මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. කේ.ජ්. චන්දන කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. ර්.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 8. ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. ඩී.සුදත් අරුණ රංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 12. එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 13. මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 15. වේලුසාමි එලිල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 16. එම්.ජ්. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 17. එච්.ජ්.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 18. ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

## 01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.11.10 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සහා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්. එල්. සුදර්ශන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

- 2022-12-15 වන දින සිට හපුතලේ ප්‍රාදේශීය සභාව තුළ ප්‍රජාවගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීම අරමුණු කර ගනිමින් පෙරටු කාර්යාලයක් ආරම්භ කිරීම සිදු කරන බව නිවේදනය කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා පිළිබඳවත් එකී යෝජනා ක්‍රියාත්මක කර ගැනීමට මහජන නියෝජිතයන් ලෙස දැක්වූ දායකත්වය සඳහා ස්තූතිය ප්‍රකාශ කරන ලදී.

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

- එරණවෙල, කහත්තේවෙල වසම්හි මාර්ගලවට වැටී ඇති පස් කඳු ඉවත් කිරීමට බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙසට එතුමා විසින් යොමු කර ඇති ලිපිය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය

- බිංගේතැන්න ග්‍රාම නිලධාරි වසමේ පදිංචි අලුත්ගෙදර සෝමාවතී යන අයට තහඩු 10ක් ලබා දෙන ලෙසට බිංගේතැන්න වසමේ ග්‍රාම නිලධාරි විසින් ඉල්ලීම් කර ඇති ලිපිය
- ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය අසල කාණුව සම්බන්ධයෙන් විහාරාධිපති හිමි විසින් යොමු කර ඇති ලිපිය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. රාමනායක මහතා

- ගෘහස්ථ විදුලි පරිපථ ලබා දෙන ලෙසට රත්කරව්ව පී.ජී. පුබුදු මහතා විසින් යොමු කර ඇති ලිපිය
- පාසල් භූමිය තුළ රිළවුන් , බල්ලන්, මොණරුන් ආදී වන සතුන් සැරිසැරීම නිසා මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය සම්බන්ධයෙන් බ/ ශ්‍රී ජනානන්ද ජාතික පාසලේ විදුහල්පතිතුමා විසින් යොමු කර ඇති ලිපිය

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2023 වර්ෂය සඳහා සුළු මුදල් අග්‍රිමය ලෙස රුපියල් 10000.00ක මුදලක් මුදල් අයකැමි භාරයේ තැබීමත්, එක් වරකදී රුපියල් 1500.00 ක උපරිමයට යටත්ව ගෙවීම සුදුසු බවත් එකී අග්‍රිමය තුලින්ම වාහන සුළු අළුත්වැඩියා කටයුතු සඳහා ද මුදල් වියදම් දැරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

2023 වර්ෂය සඳහා සුළු මුදල් අග්‍රිමය ලෙස රුපියල් 10000.00ක මුදලක් මුදල් අයකැමි භාරයේ තැබීමත්, එක් වරකදී රුපියල් 1500.00 ක උපරිමයට යටත්ව ගෙවීම සුදුසු බවත් එකී අග්‍රිමය තුලින්ම වාහන සුළු අළුත්වැඩියා කටයුතු සඳහා ද මුදල් වියදම් දැරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී සභාව විසින් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා දැරිය යුතු පිරිවැය සැළකිල්ලට ගෙන පෙර වර්ෂයේ මෙන්ම පළාත් පාලන දෙපාර්තමේන්තුව හා බණ්ඩාරවෙල නගර සභාවේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් සැළකිල්ලට ගැනීම සුදුසු බවත්, ඊට අමතරව ප්‍රාදේශීය වශයෙන් සිටින ව්‍යාපාරික ප්‍රජාව

සඳහා ප්‍රමුඛත්වය ලබා දීමත්, බොහෝ වාහන අමතර කොටස් හා සුවිශේෂී භාණ්ඩ පවතින ආයතන සඳහා අවධානය යොමු කරමින් , ප්‍රසම්පාදන කටයුතු සඳහා යොදා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී සභාව විසින් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා දැරිය යුතු පිරිවැය සැළකිල්ලට ගෙන පෙර වර්ෂයේ මෙන්ම පළාත් පාලන දෙපාර්තමේන්තුව හා බණ්ඩාරවෙල නගර සභාවේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් සැළකිල්ලට ගැනීම සුදුසු බවත්, ඊට අමතරව ප්‍රාදේශීය වශයෙන් සිටින ව්‍යාපාරික ප්‍රජාව සඳහා ප්‍රමුඛත්වය ලබා දීමත්, බොහෝ වාහන අමතර කොටස් හා සුවිශේෂී භාණ්ඩ පවතින ආයතන සඳහා අවධානය යොමු කරමින් , ප්‍රසම්පාදන කටයුතු සඳහා යොදා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) හා 14(1) බලතල ප්‍රකාරව 2022 වර්ෂය සඳහා පත් කර ගනු ලැබූ මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව, 2023 වර්ෂයේ ජනවාරි මස පැවැත්වෙන මහ සභා වාරයේ දී 2023 වර්ෂය සඳහා නව මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පත් කර ගන්නා තුරු එදින දක්වා බලාත්මක කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) හා 14(1) බලතල ප්‍රකාරව 2022 වර්ෂය සඳහා පත් කර ගනු ලැබූ මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව, 2023 වර්ෂයේ ජනවාරි මස පැවැත්වෙන මහ සභා වාරයේ දී 2023 වර්ෂය සඳහා නව මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පත් කර ගන්නා තුරු එදින දක්වා බලාත්මක කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ උපාය මාර්ගික සැලැස්ම ඇතුලුව ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධනය හා ඉදිරි වර්ෂ 04ක් සඳහා සිවු අවුරුදු සැලැස්ම ද ඇතුළුව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ උපාය මාර්ගික සැලැස්ම ඇතුලුව ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධනය හා ඉදිරි වර්ෂ 04ක් සඳහා සිවු අවුරුදු සැලැස්ම ද ඇතුළුව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම සහා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 05**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වසරේ ප්‍රසම්පාදන සැලැස්මේ කාර්ය සාධනය හා වසර 03 ක ප්‍රසම්පාදන සැලැස්ම හා 2023 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සහා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වසරේ ප්‍රසම්පාදන සැලැස්මේ කාර්ය සාධනය හා වසර 03 ක ප්‍රසම්පාදන සැලැස්ම හා 2023 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සහා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 06**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ තිරසාර සංවර්ධන සැලැස්මේ කාර්ය සාධනය හා 2023 වර්ෂයේ තිරසාර සංවර්ධන සැලැස්ම සහා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ තිරසාර සංවර්ධන සැලැස්මේ කාර්ය සාධනය හා 2023 වර්ෂයේ තිරසාර සංවර්ධන සැලැස්ම සහා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 07**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ කාර්ය සාධක දර්ශකයන්ගේ කාර්ය සාධනය හා 2023 වර්ෂයේ කාර්ය සාධක දර්ශකය සහා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මහත්මිය</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ කාර්ය සාධක දර්ශකයන්ගේ කාර්ය සාධනය හා 2023 වර්ෂයේ කාර්ය සාධක දර්ශකය සහා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.කන්දසාමි මහතා 2022-12-28 වන දින ආගමික කටයුත්තක් සඳහා විදේශ ගත වීමට නියමිත බැවින් නැවත පැමිණීමට නියමිත දින වන 2023-01-04 වන දින දක්වා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතෙන් හා වෙනත් ලිඛිත නීතිය මඟින් ගරු සභාපතිතුමන් වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල , කාර්යයන් හෝ කර්තව්‍යයන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 08 වගන්තිය අනුව හපුතලේ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපති වන වයි.එම්. නිමල් අමරසිරි මහතා වෙත බලතල පැවරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.කන්දසාමි මහතා 2022-12-28 වන දින ආගමික කටයුත්තක් සඳහා විදේශ ගත වීමට නියමිත බැවින් නැවත පැමිණීමට නියමිත දින වන 2023-01-04 වන දින දක්වා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතෙන් හා වෙනත් ලිඛිත නීතිය මඟින් ගරු සභාපතිතුමන් වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල , කාර්යයන් හෝ කර්තව්‍යයන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 08 වගන්තිය අනුව හපුතලේ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපති වන වයි.එම්. නිමල් අමරසිරි මහතා වෙත බලතල පැවරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යපෘතිය - LDSP ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර මේ වන විට ඉදි කර අවසන් කිරීමට නියමිත බහු කාර්යය ගොඩනැගිල්ලේ පළමු මහළ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 - XI වගන්තියේ විධිවිධාන පරිදි වසර 10ක් සඳහා බදු දීමට අවශ්‍ය අනුමැතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.
<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>
<u>විවාද</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යපෘතිය - LDSP ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර මේ වන විට ඉදි කර අවසන් කිරීමට නියමිත බහු කාර්යය ගොඩනැගිල්ලේ පළමු මහළ1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 - XI වගන්තියේ විධිවිධාන පරිදි වසර 10ක් සඳහා බදු දීමට අවශ්‍ය අනුමැතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2023 ජනවාරි මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

2023 ජනවාරි මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස ජනවාරි 09 වන දිනය තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි තරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වර්තාව**

2022.12.05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**
2022 නොවැම්බර් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**
**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**
නැත

**08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මහත්මිය අදහස් දක්වමින් වසම් සඳහා ලැබීමට නියමිත වීථි පහන් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් තමා පසුගිය දිනක වසමෙහි පැවති රුස්වීමකදී සභාවේ මුදල් කමිටු වාර්තාව ප්‍රකාශ නොකළ බවත් ජාතික ජන බලවේගය නියෝජනය කරනු ලබන සභිකයෙක් ලෙස ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු නඩත්තු කිරීම වෙනුවෙන් කොපමණ වියදමක් දරන්නේද යන්නත් තිස්සමහරාමය ප්‍රාදේශීය සභාව මෙන් පක්ෂයේ ප්‍රතිපත්තියක් ලෙස වැටුප් ලබා නොගන්නා බවත් ප්‍රජාව විසින් බලය ලබා දෙනුයේ නම් වැටුප්වලින් තොර සභාවක් බිහි කරනු ලබන බව මහජනතාවට එහිදී පැහැදිලි කළ බව ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් දිගින් දිගටම පක්ෂ විපක්ෂ අදහස් දක්වන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් දිගින් දිගටම සභා වාරයන්හිදී අදහස් පළ කළ පරිදි කොස්ගහවත්ත - හෙළවත්ත මාර්ගයෙහි පිහිටා ඇති පාලමෙ හි සංවර්ධන කටයුතු මේ වන විට නතර කර ඇති බවත් ඒ හේතුව මත එකී ප්‍රදේශයේ ප්‍රජාවට ගමනාගමන කටයුතු සිදු කිරීම අසීරු වී ඇති බවත් මේ සඳහා මේ වන තෙක් විසඳුමක් ලැබී නොමැති බැවින් මේ පිළිබඳව සොයා බලා එකී පාලමෙ හි සංවර්ධන කටයුතු කඩිනම් කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අදහස් දක්වමින් ප්‍රථමයෙන්ම පසුගිය දිනක අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් තම වසම නිරීක්ෂණය කිරීමට පැමිණීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී.මිනිසුන්ගේ අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් සභාව ලෙස මැදිහත් වී සභා පනත්වල නීතිවලට අනුව කටයුතු කර එකී අනවසර ඉදි කිරීම් වැළැක්වීමට පියවර ගත යුතු බවත් මෙම අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් මැදිහත් නොවිය යුතු බවත් අධික බෑවුම් සහිත ප්‍රදේශවල අනවසර ඉදි කිරීම් සිදු කර ඇති බවත් මෙවැනි ක්‍රියා මෙන්ම මෙහි නීතිමය කරුණු සම්බන්ධයෙන් පුද්ගලයන් දැනුවත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමන් විසින් විශේෂ නිවේදන යටතේ දක්වන ලද පෙරටු කාර්යාල සංකල්පය ඉතාම වැදගත් කටයුත්තක් බවත් ග්‍රාම සේවා වසම්හි මාර්ග පද්ධතිවලට වර්ෂාව හේතුවෙන් කාණු වැසී ගොස් ඇති බැවින් ඒවා පිළිසකර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා විසින් අදහස් දක්වමින් දියතලාව බස් නැවතුම්පොළ භූමියෙහි වැසිකිළි පද්ධතියෙහි ඉදි කිරීම් කටයුතු මේ වනතුරු නිම වී නොමැති බවත් එහි වර්තමාන තත්ත්වය කෙසේද යන්නත් මේ හේතුවෙන් ප්‍රජාව අපහසුතාවයට ලක් වන බවත් කඩිනමින් එය භාවිතා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මේ වන විට පොදු වැසිකිළිය භාර දීමට හැකි තත්ත්වයක් තවමත් නොතිබෙන බැවින් එහි ඉදි කිරීම් කටයුතු වල නිරත ජල සම්පාදන මණ්ඩලය විසින් මේ වන තුරු එකී කර්මාන්ත බාර දී නොමැති බවත් එහි රැඳවුම් මුදල් මේ වන තෙක් නිදහස් කර නොමැති බවත් තමන් මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ දීද සාකච්ඡා කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් පසුගිය ඔක්තෝබර් මස සභාවේ දී සාකච්ඡා කළ පරිදි සමෘද්ධි කොමසාරිස්තුමන් සමඟ පැවති සාකච්ඡාව අනුව ද්‍රවිඩ මන්ත්‍රීවරුන් සමඟ අදහස් හුවමාරු කරගත් අතර මහජන නියෝජිතයන් ලෙස අප බලාපොරොත්තු වූයේ එතුමන් විසින් ප්‍රකාශ කරන ලද අදහස් නිසි පරිදි ක්‍රියාත්මක වේය යන්න බවත් නමුත් එතුමන් ප්‍රකාශ කළ කරුණු මේ දක්වා සමෘද්ධි කාර්යාල තුළ ක්‍රියාත්මක නොවේ ය යන බව ප්‍රකාශ කරන ලදී. එසේම එදින රැස්වීමේ දී සාකච්ඡා කල පරිදි සමෘද්ධි සංවර්ධන නිලධාරින් වසමෙහි රැදී සිටින දිනය ඇතුළත් කරමින් සම්පූර්ණ විස්තරයක් ලබා දෙන බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහන් කළද මේ වන තුරු එකී කටයුතු සිදු නොවූ බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සමෘද්ධි අධ්‍යක්ෂතුමන් එම සාකච්ඡාවේ දී ප්‍රධාන වශයෙන්ම ඉස්මතු කර දැක්වූයේ මහජන දීමනාව අදාළ වසම භාර නිලධාරියා විසින් වසමට ගෙන ගොස් බෙදා හැරීම සිදු කළ යුතු බවට කටයුතු කරන බව තරයේ ම ප්‍රකාශ කළද සමෘද්ධි වෘත්තීය සමිති විසින් දැනුම් දී ඇති පරිදි මුදල් රැගෙන ගොස් වසම තුළ බෙදා හැරීමට කටයුතු කිරීමේ දී යම් කිසි ගැටලුවකට මුහුණ දීමට සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් වගකීමක් දැරිය නොහැකි බව වෘත්තීය සමිති මගින් නිලධාරින් හට දන්වා ඇති බැවින් එතුමන් විසින් රැස්වීමේ දී ප්‍රකාශ කළ පරිදි කටයුතු සිදු කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් මහජනාධාර මුදල් ජනවාරි මස සිට තැපැල් කාර්යාල හරහා බෙදා හැරීමට කටයුතු සම්පාදනය කර ඇති බැවින් ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් ගැටලු අවම වේයැයි ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙම දිනවල පවතින වර්ෂාව හේතුවෙන් වතු කම්කරුවන් උණ රෝගී තත්ත්වයෙන් පෙළෙන බවත් වතු ප්‍රදේශවල ජනතාව විසින් භාවිතා කරනු ලබන උල්පත් ජලය සම්බන්ධයෙන් මේ වන විට ගැටලු මතු වී ඇති බව ද ප්‍රකාශ කරන ලදී.

වතු යටිතල පහසුකම් අමාත්‍ය ගරු සෙන්දිල් තොණ්ඩමන් මහතා පසුගිය සතියේ ග්ලැනනොර් වසමෙහි මහජනතාව කැඳවා රැස්වීමක් පවත්වා 2023 හා 2024 වර්ෂ සඳහා යෝජනා ලබා ගන්නා ලද අතර ඒ සම්බන්ධයෙන් මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්තුමන්ට හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම් වෙත ස්තූතිවන්ත වන බව සඳහන් කරමින් සභාව හරහා ස්තූතිය පළ කිරීමේ ලිපියක් යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. එසේම හපුතලේ සිට ග්ලැනනෝර්වත්ත දක්වා පාර දෙපසම මෙන්ම ගස්පහ දේවාලය අසළ කුණු කසළ දමන බැවින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු බව සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් නාලය උලග ප්‍රජා සංවිධානය විසින් කාබනික පොහොර යෙදීම තුළින් එළවලු නිෂ්පාදනය කරනු ලබන බවත් එම එළවලු අලෙවි කිරීම සඳහා කහගල්ල වත්ත ප්‍රධාන මාර්ගය අසළ තාවකාලික වෙළඳ කුටි කිහිපයක් ඉදි කර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අවසර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ප්‍රකාශ කරන ලදී.

එසේම කහගල්ල වත්තට අයත් නිවසක් මේ වන විට නාය යාමට ලක් වී අබලන් තත්ත්වයේ පවතින බැවින් එකී නිවසේ වෙසෙන ප්‍රජාව වෙත ආධාරයක් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

එසේම 2022-11-30 වන දින ගරු අමාත්‍ය සෙන්දිල් තොණ්ඩමන් මහතා කහගල්ල වත්තෙහි වතු කළමණාකාරතුමන් සමඟ සාකච්ඡාවකට පැමිණි අවස්ථාවේ දී කහගල්ල වත්තෙහි වතු සමාගමට අයත් තේ වත්ත සහිත ඉඩමට හපුතලේ නගර සභාව විසින් කසළ ගෙනවිත් දමන බවට පැමිණිල්ලක් ලද බවත් මේ සම්බන්ධයෙන් හපුතලේ ප්‍රාදේශීය සභාව දැනුවත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. මෙසේ කසළ ගෙනවිත් දැමීම හේතුවෙන් කහගල්ල වත්තෙහි සේවයේ නිරත වන කම්කරුවන් හට මෙන්ම ජීවත් වන පවුල් 1500ක ප්‍රමාණය කෙරෙහි සෞඛ්‍යයට ගැටලු රාශියක් උද්ගතව ඇති බවත් බෝවන රෝග මෙන්ම මැස්සන් , බල්ලන් ගහනය වැඩි වීමද සිදුව ඇති බව ප්‍රකාශ කරන ලදී. එබැවින් මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් අවධානය යොමු කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර ප්‍රජාව මේ වන විට මුහුණ දී ඇති අපහසුතාවයෙන් මුදවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාමීය වතු රෝහල වන ග්ලැනනෝර් වතු රෝහල්හි පවතින කාර්ය මණ්ඩල හිඟතාවය මෙන්ම රෝහල්හි පවතින අඩුපාඩු සම්බන්ධයෙන් දිගින් දිගටම කරුණු ඉදිරිපත් කරන ලද අතර මේ හේතුවෙන් වතු ප්‍රජාව බොහෝ සෙයින් අපහසුතාවයට ලක්වන බවද ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් 2022-12-15 වන දින ජනාධිපති හමුවී පවත්වනු ලබන රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. රාමනායක මහතා අදහස් දක්වමින් පසුගිය මාසය තුළ දිස්ත්‍රික්කයේ ඉඩම් හිමි ඔප්පු අහිමි ජනතාව වෙත ගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් මත බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ඔප්පු සකසන ලද බවත් හපුතලේ හොරදොරෙව්ව බෝගහහුලාව වසමෙහි පදිංචි ප්‍රජාව විසින් සිදු කර ඇති ඉල්ලීම ප්‍රකාරව බලපත්‍ර හිමි ඉඩම් සඳහා එකී ඉඩම් මැනුම් කර විධිමත් ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටු කරන මෙන් ගරු ජනාධිපතිතුමන් වෙත ඉල්ලීමක් සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.එසේම වර්තමානය වන විට බොහෝ සෙයින් රැස්වීම් පවත්වා සාකච්ඡා කරනුයේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වුවද දෛනික පොහොර මිල හමුවේ ගැටලු මතුවී තිබුණද කෙසේ හෝ ගොවියන් විසින් සිදු කරනු ලබන ගොවිතැන් සඳහා රිලවුන්, ඌරන් හා මොණරුන් වැනි වන සතුන් හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු වී ඇති බවත් මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යතුමන් දැනුවත් කිරීම සඳහා කඩිනමින් පියවර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා සඳහන් කළ පරිදි තමන් ද පක්ෂ ප්‍රතිපත්ති සමඟ කටයුතු කරන බවත් සෑම විටම ජනතාව වෙනුවෙන් පෙනී සිටින බවත් පසුගිය සමයේ පොහොර සම්බන්ධයෙන් පැවති උද්ඝෝෂණවලට සහයෝගය ලබා දුන් බවත් මින් ඉදිරියටත් ජනතාව සමඟ කටයුතු කරන බවත් මේ වන තුරු කිසිදු ගැටලුවක් ඇති කර නොගනිමින් සභාව තුළ සියලුම මන්ත්‍රී මණ්ඩලය කටයුතු කළ බවත් 2023 වර්ෂය ජනතාවට වැඩ කළ හැකි වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කන්දසාමි මහතා අදහස් දක්වමින් වතු ප්‍රජාව මෙන්ම සංචාරකයින් බොහෝ සෙයින් භාවිතා කරනු ලබන හපුතලේ - දඹේතැන්න මාර්ගය ඒබීසී යොදා සංවර්ධනය කිරීමට කටයුතු ආරම්භ කර තිබුණ ද මේ වන විට එකී කටයුතු අතරමඟ නතර වී ඇති බැවින් ප්‍රජාව මෙන්ම සංචාරකයින් මාර්ගය භාවිතා කිරීමේ දී බොහෝ සෙයින් අපහසුතාවයට ලක් වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් එකී මාර්ගයට අදාළ ඡායාරූප ඇතුළත් කරමින් වාර්තාවක් ඉදිරිපත් කර 2022-12-15 වන දින ජනාධිපති හමුවී පවත්වනු ලබන රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී.කන්දසාමි,
සභාපති ,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.